**ගොවීන්ගේ භාරකාර අරමුදල - 2023**

**-------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ගොවීන්ගේ භාරකාර අරමුදලේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 1994 මාර්තු 9 දිනැති ගොවීන්ගේ භාරකාර අරමුදලේ භාරකාර ඔප්පුව සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදල අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා

ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| **අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම** | **කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම** | නිර්දේශය |
| --- | --- | --- |
| ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 07 හි 49 වගන්තියට පටහැනිව දේපල පිරියත හා උපකරණ අයිතමයන් ප්‍රත්‍යාගණනයේදී එම වත්කම අයත්වන දේපල පිරියත හා උපකරණ පන්තිය මුළුමනින්ම ප්‍රත්‍යාගණනය කර නොතිබූ අතර එම ප්‍රමිතියේ 42 වගන්තිය ප්‍රකාරව රු.513,575 ක් වූ සම්පූර්ණයෙන් ක්ෂය කර තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවති වත්කම් ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කර නොතිබුණි. | ප්‍රත්‍යාගණන කමිටු වාර්තාවට අනුව මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් වුව ද භාරකාර අරමුදල අබලි ලෙස ඉවත් කර ඇති බැවින් ප්‍රත්‍යාගණන අගය 0 ලෙස දක්වා ඇති අතර 2022 වර්ෂයේ මිලටගත් ලී කබඩ් ප්‍රත්‍යාගණනය කර නොමැත. | ප්‍රමිතය ප්‍රකාරව සම්පූර්ණයෙන් ක්ෂය කර ප්‍රයෝජනයට ගනු ලබන වත්කම් ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම** | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | සම්පූර්ණයෙන් ක්ෂය කළ නමුත් භාවිතයට ගනිමින් පැවති, 2023 වර්ෂයේ සැප්තැම්බර් මාසයේ දී ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කර තිබුණු වත්කම් සඳහා ප්‍රත්‍යාගණිත දිනයේ සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා කාලපරිච්ඡේදය සඳහා අදාළ ක්ෂය වියදම හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. | සියලුම ප්‍රත්‍යාගණන වත්කම් 2023 වර්ෂය සඳහා ක්ෂය කර නොමැත. | ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කල වත්කම් වල ක්ෂය වියදම හඳුනාගත යුතුය. |
| (ආ) | රු.7,241,656 ක් ලෙස ඉතිරිකිරීමේ ගිණුමේ ශේෂයක් පෙන්වා තිබුණද සත්‍ය වශයෙන්ම එම ගිණුමේ එබඳු ශේෂයක් නොපවතින බැවින් මෙම වටිනාකමින් ජංගම වත්කම් අධිගණනය වී තිබුණි. | මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වත්කම් ලෙස දක්වා ඇති රු.7,241,656 ක් වූ ඉතිරි කිරීමේ ගිණුමේ ශේෂය අරමුදල ආරම්භයේදී අරමුදලට පවරන ලද ශේෂයක් වන අතර මේ සම්බන්ධයෙන් | සත්‍ය වශයෙන් පවත්නා ශේෂ පමණක් ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | කමිටුවක් පත්කර ගිණුම් පොත්වලින් ඉවත් කර ගැනීම සම්බන්ධ ඉදිරි කටයුතු සිදු කරමින් පවතී. | |
| (ඈ) | රු.1,193,727 ක් වූ හඳුනා ගත නොහැකි ලැබිය යුතු පොලී ශේෂය, රු.14,347,914 ක ලැබිය යුතු කෙටිකාලීන ණය ශේෂය සහ භාරකාර අරමුදල පිහිටුවීමේදී පවරා ගෙන තිබුණු රු.9,112,579 ක් වූ ගොවි කමිටු ණය ශේෂයන් අයකර ගැනීමේ හැකියාව අවිනිශ්චිත වන අතර ඒ සඳහා හානිකරණ වෙන් කිරීම් කර නොතිබුණි. | රු.1,193,727 ක වෙනත් ලැබිය යුතු ණය පොලී ශේෂය ඉදිරියේදී ගිණුම් පොත් වලින් ඉවත් කිරීමටත්, රු.14,347,914 ක ලැබිය යුතු කෙටි කාලීන ණය ශේෂයේ රු.9,347,696 ක ශේෂය සම්බන්ධව කමිටුවක් පත්කර ඉදිරි කටයුතු සිදු කරමින් හා රු.700,218 ක ණය ශේෂය සම්බන්ධයෙන් මු.රෙ. 104 පරීක්ෂණක් සිදු කර ඉදිරි කටයුතු සිදු කිරීමට යෝජිතව ඇති අතර, රු.4,300,000 ක ණය ශේෂය සම්බන්ධයෙන් නීතිපති වෙත යොමු කර ඇත. රු.9,112,579 ක ගොවි කමිටු ණය ශේෂය සම්බන්ධයෙන් කමිටුවක් පත්කර ඉදිරි කටයුතු සිදු කරමින් පවතී. | අවිනිශ්චිත ශේෂ සඳහා හානිකරණය වෙන් කිරීම් කළ යුතුය. |
| (ඈ) | 2002 වර්ෂයේ දී චක්‍රීය අරමුදල සහ කෘෂිකාර්මික භාර අරමුදල ඒකාබද්ධ කර ගොවීන්ගේ භාරකාර අරමුදල පිහිටුවීමේදී පවරා දුන්, රු.697,644 ක් වටිනා ගොවීන්ගේ තැන්පතු, රු.591,965 ක් වටිනා කොටස් ගිණුම සහ රු.159,399,408 ක් වූ ගොවිසෙත අරමුදලෙහි සඳහන් ශේෂයන් සනාථ කිරීම සඳහා කිසිඳු සාක්ෂියක් ඉදිරිපත් නොවූ නිසා එම ශේෂයන්ගේ නිවැරදිතාවය තහවුරු කර ගත නොහැකි විය. | 2002 වර්ෂයේදී චක්‍රීය අරමුදල හා කෘෂිකාර්මික භාරකාර අරමුදල ඒකාබද්ධ කිරීමේදී ගොවීන්ගේ භාරකාර අරමුදලට පවරන ලද විගණන විමසුමේ දක්වා ඇති රු.160,689,017 ක ශේෂයන් සඳහා 2002 අප්‍රේල් 01 දිනට ශේෂ ලැයිස්තුවක් පමණක් ගොවීන්ගේ භාරකාර අරමුදල සතුව පවතින අතර එම ශේෂ ලැයිස්තුව විගණනය වෙත ඉදිරිපත් කර ඇත. | ශේෂයන් සනාථන ඉදිරිපත් වීම අනුව ඒවායේ නිවැරදිතාවය තහවුරු කර ගත යුතුය. |
| (ඉ) | වී අලෙවි මණ්ඩලයට ණය ලබාදීම සඳහා ඇතිකරගෙන තිබුණු ගිවිසුම ප්‍රකාරව ණය මුදල ලබා දුන් දිනයේ සිට ණය ආපසු ගෙවීම ආරම්භ වන දිනය එනම් 2023 ජූලි 31 සිට සැප්තැම්බර් 30 දක්වා වූ කාලයට අදාළ පොලිය රු.3,814,633 ක් ගිණුම්ගත කර නොතිබුණි.. | ගිවිසුම් ප්‍රකාරව ණය මුදල සහ පොලී ගෙවීම් ආරම්භ වනුයේ ඔක්තෝබර් මස 01 සිට ජනවාරි 31 දින දක්වා බැවින් එම කාලපරිච්ඡේදයට අදාළව පමණක් පොලී ගණනය කර ඇත. කෙසේ නමුත් ගිවිසුම් ප්‍රකාරව අදාළ_කාලසීමාව තුළ දී මුළු ණය මුදල හා පොලී මුදල සම්පූර්ණයෙන් අය වී ඇත. | ගිවිසුම ප්‍රකාරව පොලී ආදායම ගිණුම් තැබීම කළ යුතුය. |

### 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1994 මාර්තු 9 දිනැති ගොවීන්ගේ භාරකාර අරමුදලේ භාරකාර ඔප්පුව 14 වගන්තිය | භාරකාර අරමුදල සඳහා කාර්ය මණ්ඩල බඳවා ගැනීමේ පටිපාටියක් සකස් කර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් අමාත්‍යාංශයේ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේදී ද සාකච්ඡාවට ලක් වූ අතර ඒ අනුව ඉදිරි කටයුතු සිදු කරමින් පවතී. | බඳවා ගැනීමේ පටිපාටියක් සකස් කළ යුතුය. |
| (ආ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය I කොටස 15.1 ඡේදය (මු.රෙ 876(2)) | දැනට ක්‍රියාත්මක වන ව්‍යවස්ථාපිත නොවන අරමුදල් වහාම ක්‍රියාත්මක වන පරිදි අහෝසි කොට ඒවායේ මුදල් ශේෂයන් ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු අතර නොඑසේනම් තවදුරටත් පවත්වාගෙන යාමට සාධාරණ හේතු ඇත්නම් එවැනි අරමුදල් පාර්ලිමේන්තු පනතක් මගින් නීතිගත කිරීමට කටයුතු කළ යුතුය. එසේ වුවත්, 1994 මාර්තු 09 දිනැති ගොවීන්ගේ භාරකාර ඔප්පුව මගින් ස්ථාපිත කර ඇති මෙම අරමුදල, ඒ අනුව කටයුතු කර නොතිබුණි. | ගොවීන්ගේ භාරකාර අරමුදල භාර ඔප්පුවක් මගින් ක්‍රියාත්මක වන අතර අදාළ පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදු කරමින් පවතී. | චක්‍රලේඛය ප්‍රකාරව පාර්ලිමේන්තු පනතක් මගින් නීතිගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයට අදාළ ආකෘතිපත්‍ර සහ මාර්ගෝපදේශ 05 ඇමුණුම I පරිච්ඡේද 07 | ගොවීන්ගේ භාරකාර අරමුදලේ පරමාර්ථ ඉටු කිරීම පිළිබඳව සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි. | ගොවීන්ගේ භාරකාර අරමුදලේ පවතින අතිරික්ත මුදල් වඩා ඵලදායී පරිදි ස්ථාවර තැන්පතුවල හා භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කර ඇති අතර සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍යතාවය පරිදි එම මුදල් භාවිතයට ගනු ලබයි. | ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර ඒ අනුව කටයුතු කළ යුතු ය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.611,553,842 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.48,833,512 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.562,720,330 ක වැඩි වීමක් නිරීක්ෂණය විය. මෙම වැඩි වීම සඳහා පෙර වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය තුළදී මහා භාණ්ඩාගාරයෙන් ගොවිසෙත ලොතරැයි ආදායම් ලැබීම සහ පොලී ආදායම් වැඩි වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2002 සිට 2004 වර්ෂය දක්වා අවස්ථා 9 කදී ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය වෙත එකතුව රු.102,662,700 ක ණය මුදලක් ලබාදී ඉන් රු.9,000,000 ක් වසරක් තුළදී නැවත අරමුදලට පියවීමටත්,රු.93,662,700 ක් මහනුවර පිහිටි මහබෙරියතැන්න වත්ත නමැති ඉඩම විකුණූ වහාම පියවීමටත් ගිවිසුම් ප්‍රකාරව එකඟ වී තිබුණි. එහෙත් එකඟවන අවස්ථාව වන විටදී ද බාහිර පාර්ශවයකට ඉඩම 99 අවුරුදු බදු දී තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ණය මුදල් ලබාදී වසර 21 ක් ගතවී තිබුණ ද නොපියවූ ණය ශේෂය රු.49,512,700 ක් සහ ඒ සඳහා උපචිත පොලිය රු.98,023,448 ක් හිඟව පැවතිණි. | ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය වෙත ලබා දී ඇති මෙම ණය මුදලට අදාළව මේ වන විට මාසික වාරිකය රු.500,000 බැගින් අයවේ. 2023 ජනවාරි 17 දින පැවති ගොවීන්ගේ භාරකාර අරමුදලේ අධ්‍යක්ෂ මණ්ඩල තීරණය පරිදි තවදුරටත් අයවිය යුතු ණය මුදල සම්පූර්ණයෙන් ගෙවා අවසන් කරන ලෙසට දන්වා යැවූ අතර එසේ එකවර ණය ශේෂය ගෙවා අවසන් කිරීමට ආයතනයට මූල්‍ය හැකියාවක් නොමැති බවට දන්වා එවා ඇත. | නොපියවූ ණය අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2020 වර්ෂයේදී ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත බඩඉරිඟු වගා කරන ගොවීන් සඳහා රු.200,000,000 ක ණය මුදලක් ලබාදී ඒ සඳහා රු.1,788,650 ක ලැබිය යුතු පොලියක් අයකරගතයුතු වුවද කිසිදු පොලී මුදලක් අය කරගෙන නොතිබුණි. | අදාළ ණය පොලිය අයකර ගැනීමට කටයුතු කිරීමට සටහන් කර ගතිමි. | පොලී මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2016 වර්ෂයේදී මාස 24 ක් තුළ අයකර ගැනීමට එකඟ වී රු.500,000 ක මුදලක් අර්තාපල් බෝග වගාව සඳහා ගොවි මහතෙකුට ලබා දුන්නද ව්‍යාපෘතිය ඉටුකර නොතිබුණු අතර වසර 7 ක් ගතවී ඇතත් ණය මුදල හා පොලිය අයකරගෙන නොතිබුණි. | මෙම ණය ශේෂය සම්බන්ධයෙන් ගොවිජන විනිශ්චය සභාව විසින් ඉදිරි නීතිමය කටයුතු සිදුකරමින් පවතී. | ණය මුදල හා පොලී මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රන් ගෙවිලිය සමාජ ව්‍යවසාය පොදු සමාගමට වසරක කාලයකින් ගෙවීමේ පදනම මත රු.5,966,000 ක පොලී රහිත ණයක් 2018 වර්ෂයේදී ලබා දී තිබුණද අදාළ මුදල සමාලෝචිත වර්ෂය දක්වා අයකර ගෙන නොතිබුණි. | මේ සම්බන්ධයෙන් නීතිමය කටයුතු සිදු කිරීමට නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. | ණය මුදල අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ගොවි සමාගම් වෙත ණය ලබා දීම සඳහා ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවට භාර අරමුදල විසින් වරින් වර ලබා දී තිබුණු ණය මුදල් වලින් අය වීමට ඇති ශේෂය රු.14,347,914 ක් වූ අතර වර්ෂ 24 ක සිට වර්ෂ 32 ක් දක්වා වූ කාල පරාසයක් ගතවී තිබුණි. | අය කර ගැනීම සඳහා කටයුතු සිදු කරමින් පවතී. | ණය මුදල් අයකරගැනීමටකටයුතු කඩිනම්ව කළ යුතුය. |
| (ඇ) | 2002 වර්ෂයේදී චක්‍රීය අරමුදල සහ කෘෂිකාර්මික භාර අරමුදල ඒකාබද්ධ කර ගොවීන්ගේ භාරකාර අරමුදල පිහිටුවීමේදී අරමුදලට පවරන ලද චක්‍රීය අරමුදලේ රු.44,255,850 ක කෙටි කාලීන ණය ශේෂය අයකරගැනීම සඳහා 2014 වර්ෂයේදී රු.1,490,000 ක දීමනා ගෙවා විශ්‍රාමික නිලධාරින් 10 දෙනෙකු පත් කර තිබුණු නමුත්, තවදුරටත් අයකර නොගත් ණය ශේෂය රු.39,909,275 ක් විය. | 2014 වර්ෂයේදී සිදු කරන ලද විමර්ෂණයට අනුව මේ වන විට චක්‍රීය අරමුදල් ණය ශේෂයෙන් රු.මි.4.3 කට අධික මුදලක් අයවී ඇති අතර ඉතිරි ණය ශේෂය සම්බන්ධයෙන් කටයුතු කිරීමට කමිටුවක් පත්කර ඉදිරි කටයුතු සිදු කරමින් පවතී. | ණය මුදල අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | පුද්ගලික සමාගමක් වෙත 2003 වසරේදී ලබාදී ඇති ණය මුදලින් රු.860,000 ක්, සහ උපචිත පොලී වටිනාකම රු.816,666 ක් තව දුරටත් අයවීමට පැවතුණි. | ප්‍රයිම් හර්බ් ලංකා පුද්ගලික සමාගමෙන් අයවිය යුතු ණය ශේෂය සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදු කිරීමට නීතිපති දෙපාර්තමේන්තුව වෙත මේ වන විට යොමු කර ඇත. | ණය මුදල අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | ලොකු ළූණු බීජ නිෂ්පාදනය කරනු ලබන ගොවීන් 63 ක් සඳහා 2016 වර්ෂය වන විට ලබා දුන් ණය මුදලින් රු.2,451,780 ක් වූ ණය ශේෂ අය නොවී පැවතුණි. | මෙම ණය ශේෂය කොටස් වශයෙන් අයවේ. අදාළ ගොවීන්ගෙන් මුදල් අයකර ගොවිජන සේවා කාරක සභා හරහා ප්‍රධාන කාර්යාලයට ලැබී ගොවීන්ගේ භාරකාර අරමුදල වෙත එම මුදල් ලැබීමේදී ප්‍රමාද වීමක් සිදුවේ. මෙම ශේෂය කඩිනමින් පියවා අවසන් කරන ලෙසට ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත දැනුම් දී ඇත. මෙම ණය මුදලට අදාළව 2024 අප්‍රේල් 30 දිනට ශේෂය රු.11,851,087 කි. | එකඟවූ පරිදි ණය මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | වසරක් ඇතුළත අයකර ගැනීමේ කොන්දේසිය යටතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ බඩඉරිඟු වගා කරන ගොවීන් සඳහා ලබා දීමට ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් වෙත 2015 වර්ෂයේදී ලබා දී තිබුණු ණය මුදලින් රු.13,223,746 ක ශේෂයක් අයවීමට පැවතුණි. | මෙම ණය ශේෂය ද කොටස් වශයෙන් අයවේ. අදාළ ගොවීන්ගෙන් මුදල් අයකර ගොවිජන සේවා කාරක සභා හරහා ප්‍රධාන කාර්යාලයට ලැබී ගොවීන්ගේ භාරකාර අරමුදල වෙත එම මුදල් ලැබීමේදී ප්‍රමාද වීමක් සිදුවේ. | එකඟවූ පරිදි ණය මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (උ) | 2022/23 මහ කන්නයේ ජාතික බීජ වී අවශ්‍යතාවය සපුරා ගැනීම සඳහා හදිසි බීජ වී මිලදී ගැනීමේ වැඩසටහන සඳහා රු.මිලියන 50 ක ණය අත්තිකාරමක් 2022 ජූලි 21 දින කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වෙත දී මාසයක් පුරා එම දෙපාර්තමේන්තුව තුළ නිශ්කාර්යව තිබී එම මුදල නැවත 2022 අගොස්තු 20 දින ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත ලබා දී තිබුණි. එම මුදලින් රු.36,656,960 ක් භාවිතා කර නොතිබුණු අතර එය ලබාදුන් මුළු මුදලින් සියයට 73.31 ක් විය. | දිස්ත්‍රික්ක 21 ක් සඳහා බීජ වී මිලදි ගැනීමට අවශ්‍යතාවය පරිදි මුදල් ඉල්ලුම් කරන ලෙස අදාළ දිස්ත්‍රික්ක වෙත ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් දැනුම් දී ඇත. බීජ වී මිලදී ගැනීම සඳහා රු.මි.50 ක මුදලක් ඇස්තමේන්තු කළ ද මුදල් ලැබෙන අවස්ථාව වන විට පෞද්ගලික අංශය තුළ බීජ වී මිලදී ගැනීම සඳහා ඉහළ මිලක් තිබුණු බැවින් ගොවිජන සේවා මධ්‍යස්ථාන සඳහා ලබා දුන් මුදල් සීමාව යටතේ එම කටයුත්ත සිදුකිරීම අපහසු වූ නිසා හම්බන්තොට, මන්නාරම, බදුල්ල සහ කෑගල්ල යන දිස්ත්‍රික්ක 04 පමණක් රු.24,600,000 ක මුදලක් ඉල්ලුම් කර තිබුණු අතර එම මුදල ලබා දී ඇත. දිස්ත්‍රික්ක 2 ක් සඳහා ලබා දුන් රු.11,256,960 ක මුළු මුදල එම මුදල් සීමාව යටතේ බීජ වී මිලදී ගැනිමට නොහැකි වීම හේතුවෙන් නැවත ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත ප්‍රතිපූරණය කර ඇත. | ලබාගත් ණය නිසි අරමුණට යොදාගන්නා බව සනාථ කර ගත යුතුය. |